ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

කෘෂි විද්‍යාව விவசாய விஞ்ஞானம் Agricultural Science	I (විශේෂ විභාගය) I (விசேட பரீட்சை) I (Special Exam)	08 S I	පැය දෙකයි இரண்டு மணித்தியாலம் Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. ලා දඬු කැබලි මගින් ප්‍රචාරණය කළ හැකි ශාකයකට උදාහරණයක් වනුයේ
(1) රෝස ය. (2) ක්‍රෝටන් ය. (3) මසද්සෙදාක්කා ය.
(4) ග්ලිරිසිඩියා ය. (5) බතල ය.

2. පහතරට වියළි කලාපය සඳහා වඩාත් යෝග්‍ය තවාන් පාත්ති වර්ගය/වර්ග වනුයේ,
(1) සමතලා පාත්ති ය. (2) ගිලුණු පාත්ති ය.
(3) උස් පාත්ති ය. (4) ගිලුණු පාත්ති සහ උස් පාත්ති ය.
(5) උස් පාත්ති සහ සමතලා පාත්ති ය.

3. කෘෂිකාර්මික ක්ෂේත්‍රවල ජල වහනය වැඩිදියුණු කිරීම සඳහා **ඉතා කලාතුරකින්** යොදාගනු ලබන ජල වහන ක්‍රමයක් වනුයේ
(1) විවෘත කාණු ය.
(2) ගල් කාණු ය.
(3) සවිවර නළ ය.
(4) ජලය පොම්ප කිරීම ය.
(5) අධික උත්ස්වේදනයක් සහිත බෝග වගා කිරීම ය.

4. සුපිරිකරණ ක්‍රියාවලියේ දී සෝඩියම් මෙටාබයිසල්ෆයිට් භාවිත කරනුයේ,
(1) ආහාර ජීවානුහරණය කිරීමට ය. (2) එන්සයිම අක්‍රිය කිරීමට ය.
(3) වර්ණය තිර කිරීමට ය. (4) ස්වාදය වැඩිදියුණු කිරීමට ය.
(5) වයනය වැඩිදියුණු කිරීමට ය.

5. ශ්‍රී ලංකාවේ කිරි ගව පාලනය සඳහා වඩාත්ම සුදුසු දේශගුණික තත්ත්වයන් ඇත්තේ
(1) පොල් ත්‍රිකෝණයේ ය. (2) වියළි කලාපයේ ය. (3) උඩරට ය.
(4) මැද රට ය. (5) පහතරට ය.

6. වැඩීම පසු අස්වනු හානියක් ඇතිය හැක්කේ
(1) බිට්රූට්වල ය. (2) පැපොල්වල ය. (3) බෝංචිවල ය.
(4) අන්නාසිවල ය. (5) අර්තාපල්වල ය.

7. බෝග වගාවක උපරිම ජල භාවිත කාර්යක්ෂමතාව ලබා ගත හැකි වනුයේ
(1) තීරු ජල සම්පාදනය මගිනි. (2) විසිරි ජල සම්පාදනය මගිනි.
(3) බිංදු ජල සම්පාදනය මගිනි. (4) බේසම් ජල සම්පාදනය මගිනි.
(5) ඇළි ජල සම්පාදනය මගිනි.

[දෙවැනි පිටුව බලන්න

8. අධික සෝඩික් පසක, නුවමාරු කළ හැකි සෝඩියම් ප්‍රතිශතය (ESP%) විය හැක්කේ,
(1) 8 ය. (2) 10 ය. (3) 12 ය. (4) 14 ය. (5) 16 ය.

● ප්‍රශ්න අංක 9 ට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන භාවිත කරන්න.


P


Q

9. ඉහත රූප සටහනේ P සහ Q මගින් නිදර්ශනය වන්නේ පිළිවෙළින්
(1) මුල් කැබලි සහ කඳ කැබලි මගින් සිදුකරන ශාක ප්‍රචාරණය වේ.
(2) මුල් කැබලි සහ ධාවක මගින් සිදුකරන ශාක ප්‍රචාරණය වේ.
(3) භූමි අතු බැඳීම සහ කඳ කැබලි මගින් සිදුකරන ශාක ප්‍රචාරණය වේ.
(4) ගොඩැලි අතු බැඳීම සහ ධාවක මගින් සිදුකරන ශාක ප්‍රචාරණය වේ.
(5) රයිසෝම සහ ධාවක මගින් සිදුකරන ශාක ප්‍රචාරණය වේ.


10. ග්ලයිෆොසේට් යනු
(1) සංස්ථානික, වරණීය සහ පූර්ව නිර්ගමන වල්නාශකයකි.
(2) ස්පර්ශ, වරණීය සහ පූර්ව නිර්ගමන වල්නාශකයකි.
(3) සංස්ථානික, වරණීය සහ පසු නිර්ගමන වල්නාශකයකි.
(4) ස්පර්ශ, වරණීය නොවන සහ පූර්ව නිර්ගමන වල්නාශකයකි.
(5) සංස්ථානික, වරණීය නොවන සහ පසු නිර්ගමන වල්නාශකයකි.

11. සංරක්ෂිත කෘෂිකර්මාන්තයේ දී භාවිත වන ක්‍රමයක් වනුයේ
(1) වර්ෂාපෝෂිත කෘෂිකර්මයයි.
(2) රසායනික පොහොර යෙදීමයි.
(3) සමෝච්ච මත බෝග වගා කිරීමයි.
(4) සූක්ෂ්ම කෘෂිකර්මාන්තයයි.
(5) නිර්පාංශු වගාවයි.


12. ගවයකුගේ සංකීර්ණ ආමාශය තුළ ආහාර ගමන්කරන නිවැරදි ගමන් මාර්ගය වනුයේ
(1) විතංගිකාව ⟶ රූමනය ⟶ ජඨරාගය ය.
(2) රූමනය ⟶ ජඨරාගය ⟶ විතංගිකාව ය.
(3) රූමනය ⟶ බහුනැමිය ⟶ විතංගිකාව ය.
(4) රූමනය ⟶ විතංගිකාව ⟶ බහුනැමිය ය.
(5) විතංගිකාව ⟶ රූමනය ⟶ බහුනැමිය ය.


13. විසිරි ජල සම්පාදනය හා බිංදු ජල සම්පාදනය පිළිබඳ වගන්ති තුනක් පහත දක්වා ඇත.
A - මෙම ක්‍රම දෙකෙහිදීම සමාන ජල පීඩනයක් අවශ්‍ය වේ.
B - පස මතුපිට ජලය ගලා යාමක් සිදු නොවන නිසා පාංශු ඛාදනය අවම වේ.
C - මෙම ක්‍රම දෙකම ඕනෑම භූ විෂමතා තත්ත්වයක් තුළ යොදා ගත හැකි ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.


14. ශාක ශ්වසන වේගය සහ උෂ්ණත්වය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරනු ලබන ප්‍රස්තාරය වනුයේ

(1)


(2)


(3)


(4)


(5)


15. ද්විතියික ආහාර ඇසුරුම්කරණයක් සඳහා උදාහරණයක් වනුයේ

(1) කිරිපිටි පැකට්ටුවේ ඇති කාඩ්බෝඩ් පෙට්ටියයි.
(2) බටර් ආවරණය කර ඇති ඇලුමිනියම් දවටනයයි.
(3) ඇපල් ගෙඩිය දවටා ඇති ස්ටයිරොෆෝම් ආවරණයයි.
(4) මිරිස් කුඩු බහාලූ පොලිතීන් පැකට්ටුවයි.
(5) දියර කිරි ඇසිරීමට ගනු ලබන ටෙට්‍රා දවටනයයි.

16. ආරක්ෂිත ගෘහ සඳහා යොදාගන්නා ආවරණ ද්‍රව්‍ය කිහිපයක් පහත දක්වා ඇත.

A - කෘමි ප්‍රතිරෝධී දැල්
B - පාරජම්බුල කිරණ වළක්වන පොලිතීන්
C - අධි ඝනත්ව පොලිතීන්

ඉහත සඳහන් ආවරණ ද්‍රව්‍ය අතුරෙන්, පහතරට තෙත් කලාපයෙහි ඇති ආරක්ෂිත ගෘහයක් සඳහා වඩාත් ම සුදුසු වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A සහ C පමණි.

17. කෘෂි කාලගුණික ඒකකයක විවිධ කාලගුණික පරාමිතීන්ගේ පාඨාංක ලබා ගැනීමේ වාර ගණන එක් එක් පරාමිතිය අනුව වෙනස් වේ. වර්ෂාපතන දත්ත ලබාගැනීම සිදු කරනුයේ,

(1) දිනපතා පෙ.ව. 8.30 ට ය.
(2) දිනපතා ප.ව. 3.30 ට ය.
(3) සෑම වර්ෂාවක්ම අවසාන වීමත් සමග ය.
(4) දිනපතා පෙ.ව. 8.30 ට සහ ප.ව. 3.30 ට ය.
(5) සෑම වර්ෂා සමයක්ම අවසානයේ දී ය.

[හතරවැනි පිටුව බලන්න

18. [illegible]

(1) [illegible]

(2) [illegible]

(3) [illegible]

(4) [illegible]

(5) [illegible]

19. [illegible]

(1) [illegible]

(2) [illegible]

(3) [illegible]

(4) [illegible]

(5) [illegible]

20. [illegible]

(1) [illegible] (FAO) [illegible]

(2) [illegible] (WFP) [illegible]

(3) [illegible] (IRRI) [illegible]

(4) [illegible] (IWMI) [illegible]

(5) [illegible] (IFPRI) [illegible]

21. [illegible]

A - [illegible]

B - [illegible]

C - [illegible]

[illegible]

(1) A [illegible] (2) B [illegible] (3) C [illegible]

(4) A [illegible] B [illegible] (5) B [illegible] C [illegible]

22. [illegible]

(1) [illegible] 12 [illegible] (2) [illegible] 18 [illegible] (3) [illegible] 24 [illegible]

(4) [illegible] 2 - 3 [illegible] (5) [illegible] 3 - 4 [illegible]

23. [illegible]

(1) [illegible]

(2) [illegible]

(3) [illegible]

(4) [illegible]

(5) [illegible]

24. [illegible]

(1) Mg, Cu [illegible] Zn [illegible]

(2) Mn, Mo [illegible] H [illegible]

(3) Cu, Zn [illegible] H [illegible]

(4) Fe, Zn [illegible] Mn [illegible]

(5) Fe, Zn [illegible] Ti [illegible]

• ප්‍රශ්න අංක 25 ට පිළිතුරු දීම සඳහා පහත රූප සටහන යොදා ගන්න.



25. ඉහත රූප සටහනෙන් දක්වා ඇති ශාක වගා පද්ධතිය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ
   (1) ඒක ශාක වගා පද්ධතියක් ලෙස ය.
   (2) තීරු අනුක්‍රමික වගා පද්ධතියක් ලෙස ය.
   (3) කඩින් කඩ ශාක වගා පද්ධතියක් ලෙස ය.
   (4) මිශ්‍ර ශාක වගා පද්ධතියක් ලෙස ය.
   (5) බහු ස්ථර ශාක වගා පද්ධතියක් ලෙස ය.

26. සත්ත්ව අභිජනනය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දක්වා ඇත.
   A - සමූහ වරණය මගින් අද්විතීය සතුන්ගේ ප්‍රවේණික විභවය පරම්පරාවෙන් වැඩිදියුණු කළ හැකි ය.
   B - දෙමුහුන් අභිජනනය, ගොවිපළ සතුන්ගේ ප්‍රවේණික විභවය වැඩිදියුණු කිරීමට යොදාගන්නා ප්‍රධාන ක්‍රමයකි.
   C - දෙමුහුන් අභිජනනය හේතුවෙන් දෙමුහුන් දිරිය ඇති කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,
   (1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
   (4) A සහ B පමණි. (5) A සහ C පමණි.

27. දුඹුරු පැහැති බිත්තර දමන කුකුළු වර්ගය/වර්ගයන් වනුයේ,
   (1) ගෝල්ඩන් කොමට් ය. (2) ෂේවර් 288 ය.
   (3) හයිසෙක්ස් බ්‍රවුන් සහ ෂේවර් 288 ය. (4) වයිට් ලෙග්හෝන් ය.
   (5) හයිලයින් වයිට් ය.

28. "වර්තමාන සහ අනාගත පරම්පරාවල අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ හැකියාවට හානියක් නොවන පරිදි සමාජයේ ජනතාවගේ ආහාර අවශ්‍යතාවන් ඉටුකර ගැනීම සඳහා සිදු කරන ගොවිතැන."
ඉහත ප්‍රකාශයෙන් වඩාත් හොඳින් විස්තර කරනුයේ
   (1) සංරක්ෂණ කෘෂිකර්මාන්තයයි.
   (2) පාරම්පරික කෘෂිකර්මාන්තයයි.
   (3) තිරසාර කෘෂිකර්මාන්තයයි.
   (4) වර්ෂාපෝෂිත කෘෂිකර්මාන්තයයි.
   (5) කාබනික කෘෂිකර්මාන්තයයි.

29. දර්ශීය පාංශු පැතිකඩක
   (1) O ස්තරයෙන් ක්ෂාලනය වන කාබනික ද්‍රව්‍ය A සහ B ස්තරවල එකතු වේ.
   (2) O සහ A ස්තරවලින් ක්ෂාලනය වන කාබනික ද්‍රව්‍ය B සහ C ස්තරවල එකතු වේ.
   (3) O ස්තරයෙන් ක්ෂාලනය වන කාබනික ද්‍රව්‍ය A ස්තරයේ එකතු වේ.
   (4) A ස්තරයෙන් ක්ෂාලනය වන කාබනික ද්‍රව්‍ය B ස්තරයේ එකතු වේ.
   (5) A සහ B ස්තරවලින් ක්ෂාලනය වන කාබනික ද්‍රව්‍ය C ස්තරයේ එකතු වේ.

30. ගොවියෙකු කොම්පෝස්ට් ගොඩ සකසා සතියකට පසු අග උල් කරන ලද ලී පිටික් කොම්පෝස්ට් ගොඩ තුළට ඇතුල් කර වරින් වර පරීක්ෂා කරන ලදී. මෙම ක්‍රියාව සිදු කරනු ලබනුයේ කොම්පෝස්ට්වල

(1) pH පරීක්ෂා කිරීමට ය.
(2) උෂ්ණත්වය පරීක්ෂා කිරීමට ය.
(3) ලවණතාව පරීක්ෂා කිරීමට ය.
(4) C:N අනුපාතය පරීක්ෂා කිරීමට ය.
(5) පෝෂක ප්‍රමාණය පරීක්ෂා කිරීමට ය.

31. පීඩන තාපකයක් මගින් රෝපණ මාධ්‍ය ජීවාණුහරණය කිරීමේ දී තිබිය යුතු උෂ්ණත්වය, පීඩනය සහ කාල පරාසය වනුයේ පිළිවෙළින්

(1) 121 °C, 1.60 kg/cm^2 සහ මිනිත්තු 15-20 ක් ය.
(2) 100 °C, 1.60 kg/cm^2 සහ මිනිත්තු 15-20 ක් ය.
(3) 121 °C, 1.06 kg/cm^2 සහ මිනිත්තු 15-20 ක් ය.
(4) 112 °C, 1.06 kg/cm^2 සහ මිනිත්තු 20-30 ක් ය.
(5) 100 °C, 1.06 kg/cm^2 සහ මිනිත්තු 20-30 ක් ය.

32. පසෙහි පොස්පරස් සුලබතාව ඉතා අඩු අගයක් පෙන්වන්නේ pH පරාසය

(1) 3.0 - 4.0 වන විට ය.
(2) 4.0 - 6.0 වන විට ය.
(3) 4.0 - 7.0 වන විට ය.
(4) 5.5 - 6.5 වන විට ය.
(5) 7.0 - 8.0 වන විට ය.

33. නිර්පාංශු වගාව පිළිබඳ වගන්ති තුනක් පහත දැක්වේ.

A - ජල භාවිතය අඩු ය.
B - පොහොර භාවිතය වැඩි ය.
C - සියලු පෝෂක බාහිරින් සපයනු ලබයි.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වගන්තිය/වගන්ති වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A සහ C පමණි.

34. ගොවිපළක මුළු පිරිවැය (TC) පහත දක්වා ඇත.

$TC = 100 + 2Q + Q^2$ Q යනු නිමැවුම් ප්‍රමාණයයි.

Q = 5 නම්, ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය අනුපිළිවෙළින්

(1) 10 සහ 3.5 වේ.
(2) 10 සහ 35 වේ.
(3) 10 සහ 135 වේ.
(4) 100 සහ 3.5 වේ.
(5) 100 සහ 35 වේ.

35. පසෙහි දෘශ්‍ය ඝනත්වය සෘජුව ම භාවිත කළ හැක්කේ

(1) පාංශු ඛනිජ ප්‍රමාණය පිළිබඳ අදහසක් ලබාගැනීම සඳහා ය.
(2) පාංශු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ අදහසක් ලබාගැනීම සඳහා ය.
(3) පසෙහි සුසංහිතබව පිළිබඳ අදහසක් ලබාගැනීම සඳහා ය.
(4) පාංශු ව්‍යුහය පිළිබඳ අදහසක් ලබාගැනීම සඳහා ය.
(5) පාංශු වයනය පිළිබඳ අදහසක් ලබාගැනීම සඳහා ය.

[හත්වැනි පිටුව බලන්න

- පළිබෝධ හා රෝග ජෛව පාලනය සඳහා යොදා ගනු ලබන පරපෝෂිතයින්, විලෝපිකයන් හා ව්‍යාධිජනකයින් කිහිප දෙනෙකු පහත දක්වා ඇත. ප්‍රශ්න අංක **36** සහ **37** ට පිළිතුරු සැපයීම පිණිස මෙම ජීවීන් යොදාගන්න.

  A - වෛරස්
  B - නෙමටෝඩාවන්
  C - ලේඩිබර්ඩ් කුරුමිණියන්
  D - මකුළුවන්
  E - දෙබරුන්

36. ඉහත ජීවීන් අතුරෙන් විලෝපිකයන් සඳහා උදාහරණ වනුයේ,

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) C සහ D පමණි.
(4) A, C සහ D පමණි. (5) B, C සහ E පමණි.

37. ඉහත ජීවීන් අතුරෙන් ව්‍යාධිජනකයින් සඳහා උදාහරණ වනුයේ,

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) C සහ D පමණි.
(4) A, C සහ D පමණි. (5) B, C සහ E පමණි.

38. ගොවිපළ සතුන්ගේ ආහාර ජීර්ණය හා සම්බන්ධ වගන්ති තුනක් පහත දක්වා ඇත.

A - කාබෝහයිඩ්‍රේට ප්‍රධාන ලෙසම ජීර්ණය වනුයේ ආමාශයේ දී ය.
B - තන්තු ජීර්ණය සිදුවනුයේ රෝමාන්තිකයින් තුළ පමණි.
C - යාන්ත්‍රික ජීර්ණය මගින් ක්ෂුද්‍රජීවී ජීර්ණය හා එන්සයිමීය ජීර්ණය පහසු කරයි.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වගන්තිය/වගන්ති වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

39. බීජවල භෞතික සුප්තතාව ඉවත් කරනුයේ

(1) දිගු කාලයක් ගබඩාකොට තැබීමෙනි.
(2) 1% ගිබෙරලික් අම්ල ද්‍රාවණයේ මිනිත්තු 5 ක කාලයක් පෙඟවීමෙනි.
(3) බීජ උෂ්ණත්වය 4 °C වූ ශීතකරණයක පැය 12 ක කාලයක් තැබීමෙනි.
(4) බීජාවරණය සීරීමෙන් පසු එක් රැයක් පුරා බීජ පෙඟවීමෙනි.
(5) බීජ මිනිත්තු 20 ක පමණ කාලයක් දිලීරනාශක ද්‍රාවණයක පෙඟවීමෙනි.

40. පන් වර්ගයට අයත් වන වල් පැළෑටියකට උදාහරණයක් වනුයේ

(1) තුනැස්ස (*Cyperus iria*). (2) මාරුක් (*Echinochloa crus-galli*).
(3) ගිනිතෘණ (*Panicum maximum*). (4) නිදිකුම්බා (*Mimosa pudica*).
(5) උරු වී (*Oryza rufipogen*).

41. මෑතකදී ශ්‍රී ලංකාවේ ලොකු ලූණු වෙළෙඳපොළ කෙරෙහි පහත තත්ත්වයන් බලපාන ලදී.

A - ප්‍රධාන වශයෙන් ලොකු ලූණු අපනයනය කරන රටවල් අතුරෙන් එකක් ලොකු ලූණු අපනයනය නතර කරන ලදී.
B - දේශීය ලොකු ලූණු පාරිභෝගිකයින්ගේ ආදායම පහත වැටුණි.

ඉහත තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් ලෙස

(1) ඉල්ලුම සහ සැපයුම අඩු වේ. (2) ඉල්ලුම සහ සැපයුම වැඩි වේ.
(3) ඉල්ලුම පමණක් වැඩි වේ. (4) ඉල්ලුම වැඩි වන අතර සැපයුම අඩු වේ.
(5) ඉල්ලුම සහ සැපයුම යන දෙකම නොවෙනස්ව පවතී.

42. බටර්වල මිල ඉහළ ගියහොත් මාගරින්වල

(1) ඉල්ලුම අඩු වනු ඇත.
(2) සැපයුම් වක්‍රය දකුණට විතැන් වනු ඇත.
(3) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වනු ඇත.
(4) ඉල්ලුම් වක්‍රය වමට විතැන් වනු ඇත.
(5) සමතුලිත මිල හා ප්‍රමාණය නොවෙනස්ව පවතිනු ඇත.

43. ගඳපාන (*Lantana camara*) පාලනය කිරීම සඳහා හඳුන්වා දෙනු ලැබූ කෘමි විශේෂය වනුයේ
(1) *Teloenemia scrupulosa.* (2) *Neochetina eichhorniae.*
(3) *Paulinia acuminata.* (4) *Cactoblastis cactorum.*
(5) *Cylas formicarius.*

44. වෙළෙඳපොළ ව්‍යුහයන්ගේ ලක්ෂණ හතරක් පහත දක්වා ඇත.

A - භාණ්ඩ සඳහා ආදේශක නොමැති වීම.
B - නිෂ්පාදකයන් පැවරුණු මිලක් යටතේ ක්‍රියාත්මක වීම.
C - අධික ලාභ අඛණ්ඩව ලැබීම.
D - සැපයුම්කරුවන් අතර අන්‍යෝන්‍ය අවබෝධයක් පැවතීම.

ඉහත ලක්ෂණ අතුරෙන්, ඒකාධිකාරී වෙළෙඳපොළ ව්‍යුහයක දැකිය හැකි ලක්ෂණ වනුයේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) A, B සහ C පමණි. (5) B, C සහ D පමණි.

45. කිරිවලට සාපේක්ෂව මුල් කිරිවල
(1) ප්‍රෝටීන් වැඩියෙන් ඇත.
(2) ඛනිජ ලවණ අඩුවෙන් ඇත.
(3) විටමින් අඩුවෙන් ඇත.
(4) ලැක්ටෝස් වැඩියෙන් ඇත.
(5) මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය අඩුවෙන් ඇත.

46. එක්තරා ශාකයක සහාභිජාත ජනකයින් දෙදෙනාටම වඩා වැඩි අස්වැන්නක් F1 පරම්පරාව පෙන්නුම් කරන ලදී. මෙම සංසිද්ධිය වඩාත් හොඳින් පැහැදිලි කළ හැක්කේ,
(1) ආවේණිකතාව ලෙස ය.
(2) දෙමුහුම් දිරිය ලෙස ය.
(3) මෙන්ඩල්ගේ දෙවන නියමය ලෙස ය.
(4) ප්‍රවේණික විචලතාව ලෙස ය.
(5) රූපානුදර්ශ විචලතාව ලෙස ය.

47. උපරිම මිල සීමාව පිළිබඳ වගන්ති තුනක් පහත දැක්වේ.

A - උපරිම මිල සීමාව ප්‍රතිඵලදායී වනුයේ එය සමතුලිත මිලට වඩා ඉහළ අගයක පවතින විට දී ය.
B - උපරිම මිල සීමාව ප්‍රතිඵලදායී වනුයේ එය සමතුලිත මිලට වඩා පහළ අගයක පවතින විට දී ය.
C - ප්‍රතිඵලදායී උපරිම මිල සීමාවක් පැවතීම කෘෂිකාර්මික භාණ්ඩ වෙළෙඳපොළ හිඟයක් ඇතිවීමට හේතු වේ.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වගන්තිය/වගන්ති වනුයේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

48. දේශගුණික විපර්යාසවලට වඩාත් දායක වන බෝග වගාව වනුයේ,
(1) බඩඉරිඟු ය. (2) වී ය. (3) කැරට් ය. (4) උක් ය. (5) පොල් ය.

49. හරිතප්‍රද සංස්ලේෂණය නියාමනය කරනු ලබන ශාක හෝමෝනය වනුයේ
(1) ඔක්සින් ය. (2) සයිටොකයිනීන් ය. (3) එතිලීන් ය.
(4) ගිබරලින් ය. (5) ඇබ්සිසික් අම්ලය ය.

50. ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන සතුන්ගෙන් මිනිසාට බෝවෙන රෝගයක් වනුයේ,
(1) බෲසෙල්ලෝසිස් ය. (2) ලාදුරු ය. (3) ඩෙංගු ය.
(4) කහ උණ ය. (5) පැපොල ය.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

කෘෂි විද්‍යාව II (විශේෂ විභාගය)
விவசாய விஞ்ஞானம் II (விசேட பரீட்சை)
Agricultural Science II (Special Exam)

08 S II

B කොටස - රචනා

උපදෙස් :

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි.)

5. (i) ආහාර නරක්වීම කෙරෙහි ජල සක්‍රියතාවයෙහි බලපෑම විස්තර කරන්න.

(ii) පාංශු වාතයේ ප්‍රමාණයට හා සංයුතියට බලපාන සාධක විස්තර කරන්න.

(iii) බෝග නිෂ්පාදනය කෙරෙහි වර්ෂාපතන විචල්‍යතාවයෙහි බලපෑම පැහැදිලි කරන්න.

6. (i) එළවළුවල පසු අස්වනු හානි සඳහා බලපාන පෙර අස්වනු සාධක විස්තර කරන්න.

(ii) ශාක පෝෂක සැපයීමට අදාළව ලිබිග්ගේ අවමතා න්‍යාය පැහැදිලි කරන්න.

(iii) ආරක්ෂිත ගෘහයන්හි බෝග වගා කිරීමේ වැදගත්කම විස්තර කරන්න.

7. (i) කෘෂිකාර්මික නිෂ්පාදන හානි වෙනුවෙන් වන්දි ලබා දීම සඳහා කෘෂි රක්ෂණයෙහි වැදගත්කම විස්තර කරන්න.

(ii) ඇතැම් බෝග පැළ තවාන්ක ඇතිදැඩි කිරීමේ වැදගත්කම විස්තර කරන්න.

(iii) බෝග නිෂ්පාදනය සඳහා ආලෝකයේ තීව්‍රතාව, කාල සීමාව සහ ගුණාත්මය බලපාන ආකාරය පැහැදිලි කරන්න.

8. (i) කෘෂිකාර්මික භාණ්ඩ සැපයුමෙහි සහ ඉල්ලුමෙහි ස්වභාවය පැහැදිලි කරන්න.

(ii) පළිබෝධ කළමනාකරණයේදී යොදාගන්නා විවිධ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම විස්තර කරන්න.

(iii) බිත්තර දමන ආකාරයේ දිනක් වයසැති කුකුළු පැටවුන් මාස තුනක් දක්වා රැක බලා ගන්නා ආකාරය විස්තර කරන්න.

9. (i) බෝග ක්ෂේත්‍රවලට ජල සම්පාදනය කිරීම සඳහා සුදුසු ජලප්‍රභවයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක විස්තර කරන්න.

(ii) උසස් ගුණාත්මයෙන් යුත් කිරි ලබාගැනීම සඳහා දෙනකගෙන් කිරි දොවා ගැනීමේදී අනුගමනය කළ යුතු පියවර හේතු සමග නිවැරදි අනුපිළිවෙළට විස්තර කරන්න.

(iii) බෝග සංස්ථාපනයේදී නිරෝගී බීජ තෝරාගැනීමේ වැදගත්කම විස්තර කරන්න.

10. (i) වර්ෂා පෝෂිත වගාවේ විවිධ පියවර විස්තර කරන්න.

(ii) බෝග ක්ෂේත්‍රවලට පළිබෝධනාශක යෙදීමේදී අනුගමනය කළ යුතු ආරක්ෂිත ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(iii) අතු කැබලි මගින් ශාක ප්‍රචාරණයේදී සැලකිල්ලට ගත යුතු සාධක පැහැදිලි කරන්න.

***